**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - 2020**

**-----------------------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම් වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල කෙටුම්පත් වාර්ෂික වාර්තාද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.2 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම.**

2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 6.5.1 වගන්තිය ප්‍රකාරව; සමාලෝචනයට භාජනය වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ ආයතනයේ වාර්ෂික වාර්තා කෙටුම්පත මූල්‍ය වර්ෂය අවසානයේ සිට දින 60ක් ඇතුළත රේඛීය අමාත්‍යාංශයට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2020 සහ 2021 වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන 2023 මාර්තු 31 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදිය අනුකූල නොවීම**

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ | (i) සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ගණනය කිරීමේදී 2006 ජනවාරි සිට 2015 ජූලි දක්වා කාලය සඳහා සේවකයින්ට ගෙවා තිබූ ජීවන වියදම් දීමනාව සංස්ථාව විසින් සලකා බලා | දෛනික මෙහෙයුම් වියදම්වලට බලනොපාන අයුරින් ගෙවිය යුතු මුදල ගෙවීම සඳහා කළමනාකරණය විසින් මූල්‍ය මාර්ග සොයමින් සිටී. | සංස්ථාව අදාළ නීතිමය අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | භාර අරමුදල් පනත | නොතිබුණි. එහෙයින්, සංස්ථාව විසින් කරන ලද ගණනය කිරීම අනුව EPF සහ ETF දායක මුදල්වල හිඟ මුදල් සහ ඒ සඳහාවන අධිභාර ලෙස පිළිවෙලින් රුපියල් මිලියන 349.79 ක් සහ රුපියල් මිලියන 174.89 ක් සංස්ථාව විසින් ගෙවිය යුතුව පැවතුණි. කෙසේ වෙතත්, 2023 මාර්තු 31 වන විටත් සංස්ථාව විසින් දායක මුදල් හෝ අධිභාරවල එකතුව වූ රුපියල් මිලියන 524.68 ක් ගෙවා නොතිබුණි. | | |
| | | (ii) තවද 2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුව තිබුණු රුපියල් මිලියන 169.02 ක දායකත්ව මුදලක් සහ රුපියල් මිලියන 71.87 ක අධිභාරයක් ප්‍රේෂණය නොකර රඳවා ගෙන තිබුණි. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට නොගෙවූ දායක මුදල රුපියල් මිලියන 607.62 ක් වූ අතර, 2023 මාර්තු 31 වන විටත් එය ගෙවා නොතිබුණි. | දෛනික මෙහෙයුම් වියදම්වලට බලනොපාන අයුරින් ගෙවිය යුතු මුදල ගෙවීම සඳහා කළමනාකරණය විසින් මූල්‍ය මාර්ග සොයමින් සිටී. | සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව නියමිත වේලාවට දායක මුදල් සහ අධිභාර ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1979 දෙසැම්බර් 20 දිනැති අංක 121/1979 දරන ඇණවුම් සමඟ චෙක්පත් නිකුත් කිරීම සඳහා වූ අභ්‍යන්තර චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදය | ඇණවුම් සමඟ චෙක්පත් මගින් අත්තිකාරම් ලබා දුන් විට එවැනි අත්තිකාරම් දින 30 ක කාලයක් තුළ පියවිය යුතුය. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කරන ලද අත්තිකාරම් උපලේඛනයට අනුව, එකතුව රුපියල් මිලියන 271.28 ක් වූ අත්තිකාරම් මුදල දින 30 ක කාලයක් ඉක්මවා තිබුණ ද නොපියවා පැවතුණි. 2020 දෙසැම්බර් 31 වන විට එයින් රුපියල් මිලියන 14.27ක් සහ රු. මිලියන 225.91 ක් පිළිවෙලින් වසර එක සිට පහ දක්වා සහ වසර පහකට වැඩි කාලයක් නොපියවා පැවතුණි.<br>තවද, උපලේඛනයට අනුව ඇණවුම් සමඟ චෙක්පත්වල බැර ශේෂය රු. මිලියන 197.69 ක් වූ අතර එම | චෙක්පත් නියමිත දිනට පෙර දිනක ලියා තිබුණ ද, මේවා විශේෂයෙන් අත්තිකාරම් ගෙවීම්වල ඇතුලත් නොවන අතර, භාණ්ඩ ලබා දීමෙන් පසු ගනුදෙනු අවසන් වන අතර අභ්‍යන්තර ලිපිලේඛන සඳහා කාලය වැය වේ. ලේඛන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් ක්‍රියාවලිය පුරාම හඳුනාගෙන තිබෙන අතර, එක් එක් සිද්ධිය අනුව ප්‍රමාදයන් අවම කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | නියමිත කාලසීමාව තුළ අත්තිකාරම් පියවීම සිදුකළ යුතු අතර ඒවා පියවීය යුතු වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | බැර ශේෂයන් සඳහා හේතු විගණනයේදී අනාවරණය නොවුණි. | | |
| ඇ) | 1979 දෙසැම්බර් 20 දිනැති අංක 122/1979 දරන විශේෂ මුදල් අත්තිකාරම් පිළිබඳ අභ්‍යන්තර චක්‍රලේඛයේ 4 වන ඡේදය | සේවා හෝ භාණ්ඩ සැපයීම සඳහා විශේෂ මුදල් අත්තිකාරම් ලබා දුන් පසු එම අත්තිකාරම් දින 14 ක් තුළ පියවිය යුතුය. කෙසේ වෙතත්, වසර 05කට වැඩි රුපියල් මිලියන 10.99ක මුදල් අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවා නොතිබුණි. | විශේෂ මුදල් අත්තිකාරම් පියවීම් ක්‍රියාවලිය පාලනය කරන ලද අතර පසු වසරවලදී යම් ප්‍රමාණයන් අඩු කිරීමට එය හේතු වී තිබේ. | චක්‍රලේඛයට අනුව කාලසීමාව තුළ විශේෂ මුදල් අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු බව. |

## 2.2 කාර්යසාධනය

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 3(2) වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ ප්‍රධාන අරමුණු පහත දැක්වෙන පරිදි 2008 මාර්තු 28 දිනැති අංක 1543 දරන ගැසට් පත්‍රයේ පළ කර තිබිණි. (i) ගොඩනැගිලි, සිවිල් ඉංජිනේරු සහ අනෙකුත් ඉංජිනේරු ව්‍යාපෘති විමර්ශනය, සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීම (ii) උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම (iii) දේපල සංවර්ධන කටයුතු සිදු කිරීම (iv) සකස්කරන ලද කොන්ක්‍රීට් මිශ්‍රණ, සවිගැන් වූ කොන්ක්‍රීට් සහ පූර්ව ප්‍රත්‍යාබල කොන්ක්‍රීට් නිෂ්පාදන නිෂ්පාදනය සහ අලෙවිකිරීම (v) ඉංජිනේරු ව්‍යාපෘති/ව්‍යාපාර සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ සහ උපකරණ නිෂ්පාදනය, අලෙවිකිරීම, ආනයනය සහ අපනයනය (vi) ඉංජිනේරු සහ තාක්ෂණික සේවකයින් පුහුණු කිරීම (vii) ඉහත අරමුණු සඳහා භාවිතා කරනු ලබන ඉදිකිරීම් ද්‍රව්‍ය, ක්‍රම සහ ශිල්පීය ක්‍රම පිළිබඳ පර්යේෂණ සිදු කිරීම.

**2.2.1** සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව, ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ඉදිකිරීම් අංශය, ඉදිකිරීම් උපාංග අංශය සහ යාන්ත්‍රික හා විදුලි අංශයේ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් සම්බන්ධ කාර්ය සාධනයේ සාරාංශය පහත දැක්වේ.

| අනුක්‍රමික අංක | විස්තරය | ආදායම | | | වියදම | | ශුද්ධ ලාභය / (පාඩුව) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2019 රු. මිලියන | 2020 රු. මිලියන | වෙනස % | 2019 රු. මිලියන | 2020 රු. මිලියන | 2019 රු. මිලියන | 2020 රු. මිලියන | වෙනස % |
| 01 | පෙරසවි අංගනය - ඒකල | 240.15 | 105.02 | (56.27) | 245.49 | 196.72 | (5.34) | (91.89) | (1620.78) |
| 02 | පෙරසවි අංගනය - රත්මලාන | 78.87 | 50.35 | (36.16) | 105.94 | 90.21 | (27.08) | (39.86) | (47.19) |
| 03 | දන්කොටුව වඩු වැඩ සහ මිශ්‍ර අංගනය | 13.14 | 9.94 | (24.35) | 27.41 | 32.87 | (14.27) | (22.92) | (60.62) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 04 | දෙමටගොඩ කොන්ක්‍රීට් සිල්පර අංගනය | 221.39 | - | (100.00) | 226.09 | 16.78 | (16.78) | (4.70) | 71.99 |
| 05 | වැලිකන්ද පෙරසවි අංගනය | 2.43 | 0.02 | (99.18) | 7.78 | 4.7 | (5.35) | (4.70) | (12.15) |
| 06 | ඇලුමිනියම් වැඩ-රත්මලාන | 34.60 | 19.88 | (42.54) | 64.88 | 39.18 | (30.28) | (19.31) | 36.23 |
| 07 | පැලියගොඩ මධ්‍යම වැඩබිම | 80.31 | 21.43 | (73.32) | 66.46 | 56.07 | 13.84 | (34.64) | (350.29) |
| 08 | පෑළියගොඩ මෙහෙයුම් වැඩබිම | 64.73 | 7.12 | (89.00) | 103.29 | 52.83 | (38.57) | (45.71) | (18.51) |
| 09 | රත්මලාන වැඩබිම | 57.18 | 6.84 | (88.04) | 49.93 | 26.16 | 7.25 | (19.33) | (366.62) |
| 10 | ප්‍රවාහන සහ සැපයුම් අංශය | 61.65 | 12.90 | (79.08) | 55.43 | 39.91 | 6.22 | (27.01) | (534.24) |
| 11 | ගිනි නිවන සේවා ගොඩනැගිලි වැඩබිම | 13.74 | 5.21 | (62.08) | 16.22 | 11.57 | (2.48) | (6.36) | (156.45) |
| | එකතුව | **868.19** | **238.71** | **(72.49)** | **968.92** | **567.0** | **(112.84)** | **(316.43)** | **(180.42)** |

පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| (i) ස්ථිර වැඩබිම් සහ කර්මාන්ත සිදු කෙරෙන වැඩබිම්වල කටයුතුවල කාර්යසාධනය සම්බන්ධ ආදායම් වියදම් විස්තර විශ්ලේෂණය කිරීමෙන් පසු සමාලෝචිත වර්ෂය තුළ සියලුම වැඩබිම්වල රුපියල් මිලියන 316.43 ක පාඩුවක් ලබා තිබෙන බව නිරීක්ෂණය විය. පෙර වර්ෂය හා සසඳන විට වැඩබිම් අතර සියයට (12.15) සහ සියයට (1,620) ක පරාසය තුළ ලාභ/අලාභ පහළ යාමක් පෙන්නුම් කෙරුණි. | මෙම කාල සීමාව තුළ මුළු ශ්‍රී ලාංකීය සමාජයම කොරොනා වයිරස් වසංගත තත්ත්වය අත්විඳ තිබුණි. | ව්‍යාපාරයේ පැවැත්ම සඳහා පාඩු අවම කර ගැනීමට සහ ව්‍යාපාරයේ විකල්ප අවස්ථා හඳුනා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ii) පූර්ව වර්ෂයට සාපේක්ෂව ආදායම රුපියල් මිලියන 629.48 කින් හෙවත් සියයට 72.5 කින් අඩු වී තිබිණි. එසේ වුවදල මුළු වියදම රු. මිලියන 401.92 | ස්ථාවර පිරිවැයක් ලෙස කර්මාන්තශාලා නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ ආරක්ෂාව සඳහා වියදම් දරනු | වියදම් නිසි ලෙස පාලනය කිරීමට කටයුතු කළ යුතුයි. |

කින් හෙවත් සියයට 41.48 කින් පමණක් ලැබේ.
අඩු වී තිබිණි.

## 2.3 සංස්ථාවේ මුදල් ප්‍රවාහය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනයට සපයා තිබූ තොරතුරුවලට අනුව, ඉදිකිරීම් අංශය, ඉදිකිරීම් උපාංග අංශය, යාන්ත්‍රික හා විදුලි අංශය සහ උපදේශන අංශය 2020 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රුපියල් මිලියන 122.94 ක, රුපියල් මිලියන 76.08 ක, රුපියල් මිලියන 120.34 ක සහ රුපියල් මිලියන 54.40 ක සෘණ මුදල් ප්‍රවාහයන් පෙන්නුම් කර තිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයට අනුව මුළු මුදල් හිඟය රුපියල් මිලියන 119ක් ලෙස වාර්තා වී තිබුණි. | මුදල් කළමනාකරණය සඳහා සමීප අධීක්ෂණයක් ඇතිව විධිමත් කාරක ප්‍රාග්ධන කළමනාකරණයක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 2.4 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO) මෙහෙයුම් කටයුතු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිවල වියදම් පිළිබඳ නිරවද්‍යතාවය, සම්පූර්ණත්වය, අදාළත්වය සහ බලධාරියා තීරණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතන (NEMO) අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු ඇතුලත් ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘති තොරතුරු ඉදිරිපත් කර තිබුණි. | ව්‍යාපෘති වියදම්වල නිරවද්‍යතාවය, සම්පූර්ණත්වය, අදාළත්වය සහ බලධාරියා තීරණය කිරීම සඳහා ව්‍යාපෘති පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2.5 හඳුනා ගන්නා ලද පාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පිළිවෙලින් රුපියල් මිලියන 10.56, රුපියල් මිලියන 969.89, රුපියල් මිලියන 97.75, රුපියල් මිලියන 65.26 සහ රුපියල් මිලියන 2.12 ක් වූ ආදායම් බදු, එකතු කළ අගය මත බද්ද, ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ GST නියමිත කාලයේදී ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය | බදු පැහැරහැරීම හේතුවෙන් අධිභාර පනවා ඇතත්, අදාළ බදු පියවීමේදී ඒවා අත්හැර දැමිය හැකිය. | බදු නීතියේ නියමයන් අනුව නියමිත වේලාවට බදු සහ අධිභාර ගෙවීමට කටයුතු කළ යුතුය. |

අවසානය දක්වා රුපියල් මිලියන 143.10 ක අධිභාරයක් පනවා තිබුණි.

## 2.6 නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව සතු තක්සේරුකර නොමැති ඇලුමිනියම් බාර් සහ සිවිලිම් තහඩු තොගය 2017 වසරේ සිට ප්‍රයෝජනයට නොගෙන NEMO හි ප්‍රධාන ගබඩාවල තිබුණි. | කළමනාකරණ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මෙම වත්කම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 2.7 ව්‍යාපෘති ප්‍රමාද වීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිකිරීම් අංශය යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 1,382.49 ක් වූ ව්‍යාපෘති තුනක් ක්‍රියාකාරී සැලැස්මට අනුව 2020 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට අපේක්ෂා කරන ලද අතර, එම ව්‍යාපෘති අවසන් කිරීමේ දිනය 2023 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබිණි. | ව්‍යාපෘති සඳහා කාලය දීර්ඝ කරන ලදී. | ගනුදෙනුකරුවන් සමඟ ඇති කර ගත් ගිවිසුම් අනුව ව්‍යාපෘති අවසන් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ඉදිකිරීම් උපාංග අංශයේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 633.83 ක් වූ ව්‍යාපෘති 05 ක අපේක්ෂිත ප්‍රගතිය 2020 දෙසැම්බර් 31 දින වන විට ළඟා කර ගෙන නොතිබුණි. කෙසේ වෙතත්, අයවැය ප්‍රතිපාදන නොමැතිකම, ඉඩම්වල අයිතිය වෙනස් කිරීම සහ රාජ්‍ය අමාත්‍යාංශ විසුරුවා හැරීම ආදිය හේතුවෙන් එම ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවා තිබුණි. | සමස්ත ශ්‍රී ලාංකේය සමාජයම එම කාලසීමාව තුළ කොරෝනා වයිරස් වසංගත තත්ත්වය අත්විඳිමින් තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේදී බාධා වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.8 සම්පත් වෙනත් ආයතන වෙත මුදා හැරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක PED / 12 | ක්‍රමානුකූලව සේවකයන් ඉවත් කර | චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට |

| | | |
|---|---|---|
| දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ 8.3.9.හි දක්වා ඇති උපදෙස්වලට පටහැනිව සංස්ථාවේ සේවකයින් විසි නව (29) දෙනෙකු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලාව සහ මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත මුදා හැර තිබුණි. තවද, සංස්ථාව විසින් දරන ලද රුපියල් මිලියන 35.97 ක වැටුප් ප්‍රතිපූරණය කර නොතිබුණි. | ගැනීමට හා ලැබිය යුතු දෑ අයකර ගැනීමට දැඩිව කටයුතු කර තිබේ. | කටයුතු කළ යුතු අතර අදාළ රාජ්‍ය ආයතනවලින් වැටුප් ප්‍රතිපූරණය කළ යුතුය. |

**3. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත සේවක සංඛ්‍යාව තුළ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව තනතුරු හයක් 2020 දෙසැම්බර් 31 දින වනවිට පුරප්පාඩුව පැවතුණි. සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට හෝ සමාලෝචනය කිරීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කළමනාකරණ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | නිසි අනුමැතියක් සහිතව අත්‍යාවශ්‍ය ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව මට්ටමට බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 1.2 වගන්තියට අනුව පත්වීමක් සිදු කළ යුත්තේ අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරක් සඳහා පමණක් වන අතර, ඊට පටහැනිව, 2020 දෙසැම්බර් 31 දින වනවිට අතිරික්ත සේවකයන් 362 ක් පත් කර තිබුණි. | කළමනාකරණ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | අනුමත සේවක සංඛ්‍යාව තුළ බඳවා ගැනීම් කළ යුතුය. |
| (ඇ) | 2006 අගෝස්තු 01 දිනැති අංක 28 (ii) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිසි අනුමැතියකින් තොරව බඳවා ගැනීම් සිදු නොකළ යුතුය. කෙසේ වෙතත්, එම විධිවිධාන නොසලකා හරිමින් සංස්ථාව විසින් අනුමත නොකළ තනතුරු 09ක් සඳහා සේවකයින් 11 දෙනෙකු බඳවාගෙන තිබුණි. | කළමනාකරණ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | බඳවා ගැනීම් සම්බන්ධයෙන් කළමනාකාරීත්වය විසින් රීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම්කරණය සහ යහපාලනය**

**4.1** **වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තා 2023 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |